ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය 2021/2022

දිලික්ත නීතිය - **LWU4326 / LLU6814**

කාලය - පැය 3 යි

---

දිනය - 2023 ජනවාරි 10 | වේලාව - පෙ.ව. 9.30- ප.ව. 12.30

---

ඔබගේ අත් අකුරු පැහැදිලි විය යුතුය.

අවසර නොලත් ලේඛන, ජංගම දුරකථන හෝ වෙනත් විද්‍යුත් උපාංග විභාග ශාලාවේ දී ඔබ ලග තබා ගැනීම විභාග වරදක් බව සලකන්න.

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 ක් හිමිවෙයි.

1. *ප්‍රතිපුරුෂ වගකීම පිලිබඳ සංකල්පය විසින් තම සේවකයා විසින් කල චේතාන්විත හා චේතාන්විත නොවන වැරදි සම්බන්ධ වූ වගකීම ඔහුගේ හෝ ඇයගේ සේව්‍යයා මත, අදාල සේව්‍යයාගේ හැසිරීම දෝෂසහගත ද නැද්ද යන කරුණ නොතකා පවරනු ලැබේ.*

   *සේව්‍යයා මත එබඳු වගකීමක් පැවරීමට අදාල පසුබිම හා සීමාවන් නිර්වචනය කිරීමට අධිකරණය වෑයම් කොට තිබෙන අතර, මෙය බොහෝ විට ප්‍රතිවිරෝධී හා අසංගත නඩු තීරණ ලබා දීමෙහිලා හේතු වී තිබේ.*

   ඉහත කී ප්‍රකාශයේ පසුබිම තුල, තම සේවකයාගේ වැරදි සඳහා සේව්‍යයා මත ප්‍රතිපුරුෂ වගකීම පැවරීම සාධාරණීකරනය කිරීම සඳහා ඉදිරිපත් කොට තිබෙන තර්ක හා මෙම වගකීම බලාත්මක කිරීමට අදාලව පරිණාමය වී තිබෙන රීතීන් කවරේදැ'යි සාකච්ඡා කරන්න. ඔබ විසින් අධ්‍යයනය කොට තිබෙන නඩු තීරණ කෙතරම් දුරට මෙකී සාධාරණීකරනය කිරීම් පිලිබිඹු කරන්නේද?

2. සිවා හා දේවකී පස් හැවිරිදි පුත් මොහාන් හා හාර මසැ'ති දරුවා ද ඇතුලු සිය දරුවන් සය දෙනා සමග කොත්මලේ සත්වෝද්‍යානයට ගියහ. දරුවන්ගේ ටිකට් පත අග පහත සඳහන් ප්‍රකාශය සඳහන් විය : 'වයස අවුරුදු 12ට අඩු ලමුන් දෙමාපියන් විසින් රැකබලා ගත යුතුය'. සතුන් සිටින කූඩු අසලට නොයන ලෙසට හා සතුන්ට ආහාර නොදෙන ලෙසට දන්වමින් ඇලවූ දැන්වීම් සත්වෝද්‍යානය පුරාවට විය.

THE OPEN UNIVERSITY OF SRI LANKA

FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES

LL.B. DEGREE PROGRAMME - LEVEL 6

FINAL EXAMINATION 2021/2022

**LAW OF DELICT - LWU4326 / LLU6814**

DURATION - 3 HOURS

Date: 10th January 2023 Time: 9.30am - 12.30 pm

Please ensure that your handwriting is legible.

It is an examination offence to have unauthorized documents, mobile phones or any other electronic device with you in the examination hall.

Answer FOUR questions only. Each question carries 25 marks

1. *Vicarious liability imposes liability on an employer for the intentional or unintentional wrongs committed by his/her employee, irrespective of whether the conduct of the employer was wrongful or not.*

   *Courts have struggled to define the situations and the boundaries within which such liability will be imposed on an employer, and this has often resulted in contradictory and inconsistent judgements.*

   In the light of this statement discuss the various justifications for imposing vicarious liability on an employer for the wrongs of his/her employees, and the rules that have evolved to implement this form of liability. To what extent do the decided cases that you have studied consistently reflect these justifications?

2. Siva and Devaki took their six children including their five year old son Mohan and four month old baby to the Kotmale zoo. The children's' tickets had a statement at the bottom which said "parents must take care of children under 12 at all times." The zoo had also posted signs all over warning visitors not to go to close to the cages and not to feed animals.

   Siva had a packet of peanuts and he showed the older children how to throw them into the monkeys' cages while Mohan watched. After watching the monkeys the family moved to the cage where Nandi an endangered species of gorilla was kept. Nandi was on loan to the Kotmale zoo from the Mannar zoo. While Siva and Devaki were attending to the baby, Mohan slipped under the barrier and approached the gorilla enclosure carrying a packet of peanuts. He slipped several feet into the

සිවා සතුව කජු පැකට්ටුවක් වූ අතර මොහාන් බලාගෙන සිටිය දී කජු වඳුරන්ගේ කූඩුවලට විසි කරන්නේ කෙසේදැ'යි හේ තම වැඩිමල් දරුවන්ට ඉගැන්විය. වඳුරන් බැලීමෙන් පසුව ඔවුන් වෙනත් කුටියක් නැරඹීම පිණිස ගමන් කල අතර මෙම කුටියේ වඳවී යාමේ තර්ජනයට ලක්ව සිටි ගෝරිල්ලන් විශේෂයකට අයත් නන්දි නම් වූ සත්වයා රඳවා තිබුණි. නන්දිව තාවකාලික හුවමාරු පදනමක් මත කොත්මලේ සත්වෝද්‍යානයට ලබා ගෙන තිබුණේ මන්නාරම සත්වෝද්‍යානයෙනි. සිවා හා දේවකී දරුවා බලා ගන්නා අතර, මොහාන් වැටෙන් රිංගා ගෝරිල්ලා රඳවා සිටි පරිශ්‍රයට කජු පැකට්ටුවක් ද සමග ඇවිද ගෙන ගියේය. ලිස්සා වැටුනු ඔහු අඩි කීපයකින් පරිශ්‍ර තුල ඇද වැටුණි. මොහාන් වෙත ලංවූ නන්දි ඔහුව වඩා ගත්තාය. කෙසේ වුවද, පෙනී ගියේ ඇය ඔහුව සුරතල් කරන බව හා ආක්‍රමණශීලී ලෙස හැසිරෙන්ට උත්සාහ නොකරන බවකි. එතැනට පැමිණි සත්වෝද්‍යාන සේවකයන් මොහාන්ව බේරා ගනු පිණිස නන්දිට වෙඩි තැබූහ. මොහාන්ට නන්දි අතින් හිංසාවක් සිදුවූයේ නැත.

(අ) ගොරිල්ලා විසින් මොහාන් ඩැහැගනු දුටු දේවකී බරපතල ස්නායු කම්පනයකට ගොදුරු වූ අතර ක්ලාන්ත වූවාය. ඇය පශ්චාත් ක්ෂතිමය ආතති ආබාධයෙන් (post traumatic stress disorder) පෙලෙන්නට වූවාය. කොත්මලේ සත්වෝද්‍යානයට එරෙහිව නඩු පැවරීමට ඇය අපේක්ෂා කරයි.

(ආ) මෙම සිද්ධිය බලාගෙන සිටි ගැබිණී කාන්තාවක වූ සුමනා කම්පනය හේතු කොට ගෙන සිදු වූ දරු ගැබ ගබ්සා වීමකට මුහුණ දුන්නාය. කොත්මලේ සත්වෝද්‍යානයට එරෙහිව නඩු පැවරීමට ඇය අපේක්ෂා කරයි.

(ඇ) ගෝරිල්ලාගේ අහිමි වීම සම්බන්ධයෙන් කොත්මලේ සත්වෝද්‍යානයට එරෙහිව නඩු පැවරීමට මන්නාරම සත්වෝද්‍යානය අපේක්ෂා කරයි.

(ඉ) ගෝරිල්ලාගේ අහිමි වීමට හේතු වූ ලෙස, මොහාන්ව සතා සිටි පරිශ්‍රයට වැටීමට සැලැස්වීම සම්බන්ධව සිවා හා දේවකීට එරෙහිව නඩු පැවරීමට කොත්මලේ සත්වෝද්‍යානය අපේක්ෂා කරයි.

ඒ ඒ පැමිණිලිකරුවන්ට අදාල විත්තිකරුවන්ට එරෙහිව නඩු පැවරිය හැකි පදනම් කවරේදැ'යි සාකච්ඡා කරන්න.

3. 'නොසැලකිල්ල සම්බන්ධ නඩු වල දී අවදානම පිළිබඳ ස්වේච්ඡා පූර්වානුමානය (voluntary assumption of risk) යන විත්තිවාචකයේ පරාසය කෙතරම් සීමාකාරී ද යත් එහි ඇති වැදගත්කම අතිශය සුලුය'.

   මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? මෙම කරුණ සම්බන්ධව වන ලංකාවේ, දකුණු අප්‍රිකාවේ හා ඉංග්‍රීසි නීතියේ වඩාත්ම මෑතකාලීන නඩු වෙත අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

4. සිල්වා යනු සෙරන්ඩිබ් රාජ්‍යයේ විගණකාධිපතිවරයාය. 2021 වර්ෂයේ දී සෙරන්ඩිබ් රාජ්‍යයේ රාජ්‍ය ආයතන තුල දූෂණය හා සාවද්‍ය මූල්‍ය කලමණාකාරීත්වය බහුල වශයෙන් පවතින බවට ප්‍රකාශ කෙරෙන වාර්ෂික වාර්තාවක් ඔහුගේ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කලේය. මෙම වාර්තාව සෙරන්ඩිබ් රාජ්‍යයේ විදුලිබල අධිකාරිය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කලේය. 'පුරවැසි බැල්ම' නමින් ජාතික රූපවාහිනී සේවයේ විකාශනය වූ වැඩසටහනකට සහභාගී වූ සිල්වා විදුලිබල අධිකාරිය සම්බන්ධයෙන් වූ කොටස් ද ඇතුලු වාර්තාවේ කොටස් එහි දී උපුටා දැක්විය. ඊලග සතියේ දී පාර්ලිමේන්තුවේ විපක්ෂ මන්ත්‍රීවරයෙක් වූ බාලා විදුලිබල අධිකාරිය පිළිබඳ

enclosure. Nandi approached Mohan and picked him up. However, she appeared to be cradling him and made no attempt to be aggressive. Zoo employees who arrived at the scene shot Nandi in order to rescue Mohan. Mohan was not hurt by Nandi.

(a) Devaki suffered severe nervous shock on seeing Mohan being held by the gorilla and collapsed. She now suffers from post traumatic stress disorder. She wishes to sue the Kotmale zoo.

(b) Sumana, a pregnant woman who witnessed the incident suffered a miscarriage due to shock. She wishes to sue the Kotmale zoo.

(c) The Mannar zoo wishes to sue the Kotmale zoo for the loss of the gorilla.

(d) The Kotmale zoo wishes to sue Siva and Devaki for allowing Mohan to fall into the enclosure, which resulted in the loss of the gorilla.

Discuss the basis on which each of these plaintiffs can sue the respective defendants.

3. "In actions for negligence the defence of voluntary assumption of risk is so limited in scope that it is of little value."

Do you agree with this statement? Discuss with reference to the latest case law on this issue in Sri Lankan, South African and English law.

4. Silva is the Auditor General of the State of Serendib. In 2021 his department submitted an annual report that alleged that corruption and financial mismanagement was widespread in government institutions in Serendib. The report specifically referred to the Electricity Authority of Serendib. Silva appeared on a programme on national television called "Citizens' Watch" and highlighted sections of the report including those which referred to the Electricity Authority. The following week Bala, a member of the opposition party in Parliament quoted Silva in the course of a debate on the Electricity Authority and stated that the corruption had got worse under the tenure of Nimal, the current Chairperson of the Authority.

Later that week Nimal appeared on the programme "Citizens' Watch" and stated that the greatest corruption was in the Auditor General's Department and the report was written to cover up their own problems. He also stated that Bala was known to take bribes when he was Minister of Power and Energy under the previous government and he can prove this allegation.

(a) Nimal has filed an action for defamation against Silva and Bala.

(b) Ten other directors of the Electricity Authority have filed an action for defamation against Silva.

(c) Bala has filed an action for defamation against Nimal.

විවාදයක දී සිල්වා උපුටා දක්වමින්, අධිකාරියේ වත්මන් සභාපති වන නිමල්ගේ ධූර කාලය තුල ආයතනයේ දූෂණ තත්වය වඩාත් දරුණු අතට හැරී තිබෙන බවට අදහස් දැක්වීය.

එම සතියේ පසු දිනෙක 'පුරවැසි බැල්ම' වැඩසටහනට සහභාගී වූ නිමල් සඳහන් කලේ වැඩිම දූෂණය පවතින්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ බවත්, අදාල වාර්තාව සකස් කොට තිබුණේ එම ආයතනයේ ප්‍රශ්න යට ගැසීමේ අරමුණින් බවත්ය. බාලා පසුගිය ආණ්ඩුවේ බලශක්ති අමාත්‍යවරයා ලෙස සිටින කාලයේ අල්ලස් ගැනීම සම්බන්ධයෙන් ප්‍රකටව සිටි අයෙක් බව සඳහන් කල හේ එම චෝදනාව ඔප්පු කිරීමට තමුන්ට හැකි බව සඳහන් කලේය.

(අ) නිමල් සිල්වා හා බාලාට එරෙහිව අපහාස නඩුකරයක් ගොනු කොට තිබේ.

(ආ) විදුලිබල අධිකාරියේ තවත් අධ්‍යක්ෂකවරුන් දස දෙනෙක් අපහාසය සම්බන්ධව සිල්වාට එරෙහිව නඩුකරයක් ගොනු කොට ඇත.

(ඇ) බාලා නිමල්ට එරෙහිව අපහාසය සම්බන්ධව නඩුකරයක් ගොනු කොට තිබේ.

මෙම නඩුකර අතරින් කවරක් සාර්ථක වනු ඇද්ද? ශ්‍රී ලංකාවේ, දකුණු අප්‍රිකාවේ හා එංගලන්තයේ නඩු නීතිය උපුටමින්, රෝම ලන්දේසි හා ඉංග්‍රීසි නීති සිද්ධාන්ත ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

5. ලාල් හා මාලිනී පහලගම නම් වූ ගමෙහි පදිංචියට ගියහ. ඔවුන් එසේ කලේ මාලිනී දරුනු ලෙස ඇදුම රෝගයෙන් පීඩා විඳි බැවින්, කොලඹ නගරයේ පැවැති දූෂිත වායු තත්වය ඇයගේ සෞඛ්‍ය තත්වය අයහපත් කරන බවට වූ අවවාදය මතය. නිවෙස ගංගාවක් අසල විශාල ගෙවත්තකින් හා අලංකාර දර්ශන පථයකින් යුක්ත වූවකි. මාලිනී උසස් යැයි සම්මත වර්ගවලට අයත් බල්ලන් ඇති කිරීමෙහි යෙදුණාය.

ලාල් හා මාලිනීගේ ගෙදරට අසල්වැසි ඉඩම අයිති අප්පුහාමිටය. ඔවුන් ගමෙහි පදිංචියට පැමිණි කාලයේම වාගේ අප්පුහාමි අබලන් වූ මෝටර් රථ යලි විකිණීමේ අරමුණින් පිලිසකර කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කලේය. ඔහුගේ නිවස අබලන් වූ මෝටර් රථවලින් පිරී තිබුණි. ඔහු දවස පුරාම ඒවා පිලිසකර කිරීමේ කටයුතුවල යෙදෙන නිසා මහත් ඝෝෂාවක් නිතර පැවතුණි. මෝටර් රථ අමතර කොටස් සේදීමට ඔහු ගංගා ජලය භාවිතා කල නිසා අවට වූ ජලය තෙල්වලින් පිරී තිබුණි. මාලු ඇල්ලීමට ප්‍රිය කල ලාල්ට මේ නිසා ගංගාවේ එම අපවිත්‍ර කොටසට මාලු ඇල්ලීම සඳහා යාමේ හැකියාවක් නොවීය.

පොඩිනෝනා ජීවත් වන්නේ ලාල් හා මාලිනීගේ ඉඩමට ප්‍රතිවිරුද්ධ දිශාවේය. ඇය ජීවත කාලය පුරාවට ඌරන් හා කුකුලන් ඇති කලාය. ඌරන් නිසා හා කුකුලන්ගේ ගොම නිසා ඇති වන දුර්ගන්ධය මාලිනීගේ ඇදුම රෝගී තත්වය තවත් උග්‍ර කලේය. පොඩිනෝනාගේ ගොවිපොලේ කුකුලන් උදෑසන කෑ ගැසීම නිසා ද ලාල් හා මාලිනී කරදරයට පත්වූහ.

කෙතරම් ඉල්ලීම් කලත්, වාහන අලුත්වැඩියාව නතර කිරීමට අප්පුහාමි එකග නොවීය. ලාල් හා මාලිනී නිසා අමනාප වූ හේ දැන් වේලාසනින් වැඩ පටන් ගෙන, ප්‍රමාද වෙන තෙක්ම ඒවා කරගෙන යයි. එක් දවසක්, වාහන ධාවනය සඳහා ඔහුගේ ඉඩමේ ගබඩා කොට තිබූ පෙට්‍රල් ගිනි ගත් අතර

Which of these actions can succeed? Discuss with reference to Roman Dutch and English law citing case law from Sri Lanka, South Africa and England.

5. Lal and Malini moved to a house in the village of Pahalagama. They did so as Malini suffered from severe asthma and had been warned that the polluted air in Colombo was making her health situation worse. The house has a large garden by a river and a scenic view. Malini breeds pedigree dogs.

Appuhamy owns the land next to Lal and Malini. Soon after they moved in Appuhamy started a business repairing damaged cars for resale. His land is full of broken cars and throughout the day he works on them causing a huge amount of noise. He also washes the car parts in the river and the water in that area is full of oil. Lal, who is a keen fisherman, is unable to go fishing in that part of the river.

Podinona lives on the other side of Lal and Malini's land. She has kept pigs and hens all her life. The smell from the pigs and the fertiliser from the hens has started making Malini's asthma worse. Lal and Malini and are also disturbed each morning by the crowing of the cocks in Podinona's farm.

Despite repeated requests Appuhamy refuses to stop work on his cars. In fact he has now started work earlier and continues later, due to animosity with Lal and Malini. One day the petrol that he kept on his land to run the cars caught fire and the fire spread to Lal and Malini's land. Several trees in their garden were destroyed.

Lal and Malini wish to sue Appuhamy and Podinona. Advise them.

6. "The law will not provide compensation for damage which it regards as too remote from the accident itself. <u>This, as will be seen is a question of law rather than fact</u>. It is the law which will place a limit on recovery .... "

Harpwood, *Principles of Tort Law*, 3rd edition, (1997) at page 23.

Discuss the legal principles that the courts use to decide whether the damage caused by a defendant is too remote or not. Illustrate your answer with suitable examples from case law. In your answer you should focus in particular on the underlined sentence in the quotation.

COPYRIGHT RESERVED
**********************************

එම ගින්න ලාල් හා මාලිනීගේ ඉඩම වෙත ද පැතිරුණි. ඔවුන්ගේ වත්තෙහි වූ ගස් කීපයකට හානි සිදුවිය.

අප්පුහාමි හා පොඩි නෝනාට විරුද්ධව නඩු පැවරීමට ලාල් හා මාලිනී අපේක්ෂා කරයි. ඔවුන්ට උපදෙස් දෙන්න.

6. 'අනතුරකට පමණට වඩා දුරස්ථ යැයි සැලකෙන හානියකට වන්දි ගෙවීම නීතිය විසින් සිදු නොකරයි. <u>මෙය සෑම විටම කරුණු පිළිබද ප්‍රශ්නයකට වඩා, නීතිය පිළිබඳ ප්‍රශ්නයක් ලෙස දැකිය යුතුය</u>. යථා තත්වය අත් කරගැනීමට අදාලව සීමාවන් පනවනු ලබන්නේ නීතිය විසිනි'

Harpwood, Principles of Tort Law, 3rd edition, (1997) at page 23

විත්තිකරුවෙක් විසින් සිදුකල හානියක් පමණට වඩා දුරස්ථ ද නැද්ද යන්න විනිශ්චය කිරීම සඳහා අධිකරණ විසින් භාවිතා කරන නෛතික මූලධර්ම කවරේදැ'යි සාකච්ඡා කරන්න. නඩු නීතියෙන් ගත් සුදුසු උදාහරණ මගින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර තුල ඉහත කී ප්‍රකාශයේ යටින් ඉරි ඇඳි කොටස කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

**සියළු හිමිකම් ඇවිරිණි.**